
Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

## (පාඩම් මාතෘකාව)3.6 - නාට්‍ය පෙළ නිෂ්පාදනය(රංග භූමිය)

ලෝකයේ විවිධ රංගභූමි ඇතත් ඒ අතරින් වර්තමානයේ ශ්‍රී ලංකාවේ වැඩි වශයෙන් භාවිතා වන්නේ පින්තූර රාමු වේදිකාව වේ. ඒහි මනඃකල්පිත වශයෙන් ඇති බෙදීම නාට්‍ය අධ්‍යක්ෂවරයාට, නළුනිළියන්ට මෙන් ම ආනුෂංගික ශිල්පීන්ට ද වැදගත් වේ. රංගභූමිය මත රංග ශිල්පීන් ස්ථානගත කරවීම අධ්‍යක්ෂවරයා විසින් කළ යුතු වේ. එලෙස නළු-නිළියන් වේදිකාවේ ස්ථානගත කිරීම නාට්‍යයේ එන සිදුවීමට හේතුඵල සම්බන්ධතාව රැකෙන ලෙස සිදු කිරීමට අධ්‍යක්ෂවරයා වගබලා ගත යුතු අතර එමගින් රංගභූමියේ සමබරතාව රැකගත හැකි වේ.


රංගභූමියට ප්‍රවේශ වීම් හා පිටවීම් ද ඊට අදාළ දිශාවන් පිළිබඳ ව ද නිසි අවබෝධයක් තිබිය යුතු අතර, රංගභූමිය ඇතුළත යොදා ඇති පැති තිර පිළිබඳ ව ද මනා අවධානයෙන් යුතුව කටයුතු කිරීම අනිවාර්ය වේ. එසේම රංගභූමියේ රංගාලෝකය ප්‍රධාන වශයෙන් පතිත වන ස්ථාන නළුනිළියන් විසින් අවබෝධ කොට ගෙන තිබිය යුතු වේ.

පසුතල නිර්මාණ, නාට්‍යෝපකරණ යොදා ගන්නේ නම් ඒවා තබා ඇති ස්ථාන, භාවිත කරන අන්දම, පිළිබඳ ව අවබෝධයක් ද නළුනිළියන්ට මනා අවබෝධයක් තිබිය යුතු වේ.




රංගභූමිය භාවිත කරීමේදී නළුනිළියන් තමන් ඉදිරියේ සිටින ප්‍රෙක්ෂකයින් හට අපූර්වත්වයෙන් යුක්ත නාට්‍ය අත්දැකීමක් ලබා දිය යුතු වේ. ප්‍රධාන වශයෙන් ම සියලුම ප්‍රෙක්ෂකයින්ට සියලුම නළුනිළියන් හොඳින් දිස් වන ලෙසින් වේදිකාවේ ස්ථානගත විය යුතු වේ.

වේදිකාවේ ඉදිරිපස අසුන් පෙළෙහි දෙකෙළවර සිටින ප්‍රේක්ෂකයින්ට හොඳින් පෙනෙන ලෙස (දෘශ්‍යමය රේඛාවෙන්) මැදි වී ඇති කොටස වේදිකාවේ ප්‍රබල ස්ථාන ලෙස නම් කළ හැකි වේ. නළුනිළියන් හා ප්‍රේක්ෂක සහසම්බන්ධය තබාගැනීමෙහි ලා වේදිකාවේ ස්ථානගත වීම සෘජු ව ම බලපාන බව සත්‍යයකි.



ප්‍රශ්න -

- රංගභූමියේ මනඃකල්පිත භූගෝලීය බේදීම නම් කරන්න.
- ප්‍රේක්ෂාව හොඳින් ලබා ගැනීමට වේදිකාව ඉවහල් වන ආකාරය පැහැදිළි කරන්න.
- රංගන කාර්යය සඳහා රංග භූමියේ ඇති වැදගත්කම උදාහරණ ඇසුරෙන් පැහැදිළි කරන්න.